ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය
இலங்கைச் சாரணர் சங்கம்
Sri Lanka Scout Association
Incorporated by Act No.13 of 1957
Reg.by Boy Scout International Bureau on -22.02.1953

2026.02.05 චක්‍රලේඛ අංක 08/2026

දිසා කොමසාරිස්වරුන් වෙත

හිතවත් දිසා කොමසාරිස්තුමණි/තුමියණි,

**ජනාධිපති බාලදක්ෂ ප්‍රදාන සම්මුඛ පරීක්ෂණය 2026 පෙබරවාරි 14 , 15 සහ 21 දිනයන්හි දී**

ජනාධිපති බාලදක්ෂ ප්‍රදාන සඳහා සියළු අවශ්‍යතා සම්පූර්ණ කර, ජාතික බාලදක්ෂ මූලස්ථානයට අයදුම්පත් හා ලිපිලේඛන භාර දී ඇති බාලදක්ෂයින් සඳහා මීලග සම්මුඛ පරීක්ෂණ කටයුතු 2026 පෙබරවාරි මස 14, 15 සහ 21 යන දිනයන්හි දී පෙ. ව. 9.00 ට ජාතික බාලදක්ෂ මූලස්ථානයේ දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. සම්මුඛ පරීක්ෂණයට තෝරාගෙන ඇති බාලදක්ෂයින්ගේ නාමලේඛනය අදාල දිනයන් අනුව වෙන් වෙන් වශයෙන් අදාල දිසාවන්හි දිසා කොමසාරිස්වරුන් වෙත ලබා දීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමු.

***පහත සඳහන් කරුණු , අදාල අයදුම්කරුවන්ගේ අවධානය සඳහා යොමු කරනු ඇතැයි අපේක්ෂා කරමු.***

1. සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් 2026 පෙබරවාරි මස 14 , 15 හා 21 දින (තමාට අදාල දිනයේදී ) පෙ.ව. 8.30 ට පෙර අංග සම්පූර්ණ නිල ඇඳුමින් ජාතික බාලදක්ෂ මූලස්ථානයට පැමිණ ලියාපදිංචි විය යුතු ය. එදින පෙ.ව. 9.00 ට සම්මුඛ පරීක්ෂණය ආරම්භ කෙරේ.

2. අයදුම්කරුවන් විසින් එදින පහත සඳහන් දෑ රැගෙන ආ යුතු ය.

   a) තම පෞද්ගලික ලොග් සටහන් පොත (දිසා කොමසාරිස්තුමාගේ නිර්දේශය සහිතව)
   b) ධීරයා පා ගමන් වාර්තාව, සිතියම සහ මාලිමාව
   c) කුඩා කඹ කැබලි භාවිතා කොට තමන් විසින් ම ප්‍රායෝගිකව යෙදූ පිරිද්දීම් 3 ක්
   d) ගැට ලෑල්ල (නියමිත ප්‍රමිතියට සකස් කළ)
   e) විනාඩි 05 ක Power point Presentation එක pen drive එකකට රැගෙන එන්න.
   f) ත්‍රිකෝණ වෙළුම හා රෝල් පටි වෙළුම.
   g) සටහන් තබා ගැනීමට පොතක්/පෑනක්,අඩි කෝදුවක් යනාදිය.
   h) ජාතික හැඳුනුම් පත.
   i) තම දිවා ආහාරය හා පානීය ජලය.

3. බාලදක්ෂ ශිල්පීමය කරුණු පිළිබඳ මනා ප්‍රායෝගික දැනුමක් ලබා තිබීම අනිවාර්ය වේ. (උදා - ගැට, බැමි, පිරිද්දීම්, පාලම් පාදය, උස-දුර නිශ්චය කිරීම, ප්‍රථමාධාර, බාලදක්ෂ ඉතිහාසය, සංවිධානය ඇතුළු ජනාධිපති ප්‍රදානය හා අදාල සම්පූර්ණ විෂය නිදර්දේශය අනුව දැනුම පරීක්ෂා කෙරේ.)

65/9 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,කොළඹ 02, ශ්‍රී ලංකා
சர். சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை,கொழும்பு 02. இலங்கை.
Sir Chittampalam A Gardiner Mawatha,Colombo 02,Sri Lanka
Tel : +94 11 2 433 131/+94 11 5 231512
Fax : +94 11 2 433 131
E-mail: slsaheadq@gmail.com
Web : www.scout.lk

4. https://docs.google.com/forms/d/e/1FAIpQLSepKO8CH2Ia2Rn1OPn8vwjdddjsJjl_OmYA-COSX_q5rllhwg/viewform?usp=dialog ගූගල් පෝරමය සම්පූර්ණ කර 2026 පෙබරවාරි මස 10 වන දිනට පෙර එවිය යුතුය.

ස්තූතියි.
මෙයට, බාලදක්ෂ සේවයේ නියුතු,

ගීත් රමේෂ්
ජාතික වැඩසටහන් කොමසාරිස්

දේශාන් මිලින්ද
සහය ප්‍රධාන කොමසාරිස්

නීතිඥ මනෝජ් නානායක්කාර
ප්‍රධාන කොමසාරිස්

<u>පිටපත් -</u>

1. මූලස්ථානයේ සියළුම කොමසාරිස්වරුන්
2. සභාපති - ශ්‍රී ලංකා බාලදක්ෂ සංගමය, විධායක කමිටු සභාපති, ලේකම්, භාණ්ඩාගාරික හා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින්